# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1610 /2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2023

දිනය / திகதி / Date – 22/12/2023 පැය 1505

## මාධ්‍ය නිවේදනය

**කොළඹ සහ ගාල්ල ප්‍රදේශයෙන් සොරාගත් යතුරුපැදි 19 ක් සොයා ගැනීම - කොළඹ දකුණ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2023.11.23 වන දින කුරුඳුවත්ත සහ බම්බලපිටිය පොලිස් වසම් වල යතුරුපැදි සොරකම් කිරීම් සම්බන්ධයෙන් ලද පැමිණිලි මත කොළඹ දකුණ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් සහ බම්බලපිටිය පොලිස් ස්ථානයේ අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් එක්ව විමර්ශනයක් ආරම්භ කර තිබිණි.

ඒ අනුව විමර්ශන වලදී ලත් තොරතුරු මත තලපත්පිටිය නුගේගොඩ ප්‍රදේශයේ නිවසක් පරීක්ෂා කිරීමේදී මෙම සොරකම් කරන ලද යතුරුපැදි 03 ක්, යතුරුපැදිවලින් ගලවා ඉවත් කරන ලද ලියාපදිංචි අංක තහඩු 08 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත. සැකකරු සම්බන්ධයෙන් සිදු කරන ලද වැඩිදුර විමර්ශනයේදී සැකකරුට අයත් ගාල්ල, කලහේ ප්‍රදේශයේ පිහිටි නිවසක් තුල තිබී යතුරුපැදියක් හා යතුරු පැදිවලින් ගලවා ඉවත් කරන ලද ලියාපදිංචි අංක තහඩු 06ක් සොයාගෙන ඇත.

සැකකරු සම්බන්ධයෙන් රැඳවුම් නියෝග මත සිදු කරන ලද වැඩිදුර විමර්ශනයේදී බස්නාහිර පළාතේ කොටුව, පිටකොටුව, වැලිකඩ හා මහරගම පොලිස් වසම් වලදී සොරකම් කරන ලද යතුරු පැදි 09ක් හා ගාල්ල පොලිස් වසමේ සොරකම් කරන ලද යතුරුපැදි 06 ක් පොලිසිය විසින් සොයා ගෙන ඇත. ඒ අනුව සොයා ගන්නා ලද මුළු යතුරුපැදි සංඛ්‍යාව 19 ක් වන අතර එම යතුරුපැදිවල වටිනාකම රුපියල් 12,000,000/= ක් පමණ වන බවට පොලිසිය විශ්වාස කරනු ලබයි.

2023.12.22 වන අද දින උදෑසන බම්බලපිටිය පොලිස් ස්ථානයේදී වැඩබලන පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා විසින් අදාල යතුරුපැදි පරීක්ෂාවට ලක් කල අතර, එම අවස්ථාවට කොළඹ දකුණ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නෙරන්ජන් අභයගුණවර්ධන මහතා, පොලිස් මාධ්‍ය ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නීතිඥ නිහාල් තල්දුව මහතා ඇතුළු ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් රැසක් සහභාගී විය.

ඡායාරූප











මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.